## කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

## කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### කළමනාකරු (මානව සම්පත් හා පාලන) - තනතුරු 01

1. **සේවා ගණය** - කළමනාකාර සේවා ගණය
2. **ශ්‍රේණිය** - (MM 1-1) - 11 ශ්‍රේණිය
3. **සුදුසුකම්** - (අ) බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පරිපාලන මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර. පහක (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන්

ඉහත බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමට අදළ සුදුසුකම්

හෝ

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ MM 1-1 II ශ්‍රේණියේ මානව සම්පත් සහ පරිපාලන කටයුතුවලට අදළ තනතුරක වසර පහ (05 ) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

4. **වැටුප් පරිමාණය** - මෙම තනතුරට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව රු. 53,175 - 10 X 1,375 - 15 X 1,910 = 95,575/- (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. මීට අමතරව රජය විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

5. **බඳවා ගැනීමේ ක්‍රමවේදය** - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කරන අතර ලකුණු ලබාදීම පහත සඳහන් පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| 01. | අදළ පළපුරුද්ද | - | ලකුණු 30 |
| 02. | අදළ අතිරේක අධ්‍යාපනික සුදුසුකම් | - | ලකුණු 30 |
| 03. | වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | - | ලකුණු 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | - | ලකුණු 25 |
| | **මුළු ලකුණු ගණන** | - | **ලකුණු 100** |

සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

### 02. පරිපාලන නිලධාරී - තනතුරු 03

1. **සේවා ගණය** - කනිෂ්ඨ කළමනාකාර
2. **ශ්‍රේණිය** - (JM 1-1 - II)
3. **සුදුසුකම්** - බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම

**සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම**

**සුදුසුකම්**

ඉහත බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමට අදළ සුදුසුකම්.

හෝ

පරිපාලන විෂය කටයුතු වලට අදළව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) MA 1 - 2 සේවා ගණයේ II වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) කට නොඅඩු සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

4. **වැටුප් පරිමාණය** - මෙම තනතුරට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව රු. 42,600 - 10 X 755 - 18 X 1,135 - 70,580/- (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. මීට අමතරව රජය විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

5. **බඳවා ගැනීමේ ක්‍රමවේදය** -

පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලබන පරිදි ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු ලිඛිත තරග විභාගයක හා / හෝ පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙන් බඳවා ගැනීම් සිදු කෙරේ.

**ලිඛිත තරග විභාගය සඳහා වූ විෂය නිර්දේශය පහත දැක්වේ.**

- භාෂා ප්‍රවීනතාව
- අභියෝග්‍යතා පරීක්ෂණය
- තනතුරට අදළ වන පරිදි විෂය දැනුම

**භාෂා ප්‍රවීනතාවය :**

ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, සරල ව්‍යාකරණ රීති භාවිතය යන කරුණු පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

**අභියෝග්‍යතා පරීක්ෂණය :**

සිය නිල කාර්යයන් මැනවින් ඉටු කිරීමෙහිලා අපේක්ෂකයාගේ අභියෝග්‍යතාව ද හැකියාව ද මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

**තනතුරට අදාළ වන පරිදි විෂය දැනුම :**

තනතුරට අදළ වන පරිදි නියමිත විෂය කරුණු පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

විභාගය සමත්වීම සඳහා අපේක්ෂකයකු එක් විෂයයක් සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් ලබාගත යුතු අතර, ලකුණු මුළු එකතුව 50% ක් අවම වශයෙන් ලබාගත යුතුය.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් බඳවා ගැනීම**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීම පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| 1. | අදළ අතිරේක පළපුරුද්ද | ලකුණු 30 |
| 2. | අදළ අතිරේක සුදුසුකම් | ලකුණු 30 |
| 3. | වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | ලකුණු 15 |
| 4. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | ලකුණු 25 |
| | මුළු ලකුණු ගණන | ලකුණු 100 |

- ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලබන විට තරග විභාගයෙන් ලබාගත් ලකුණු එකතුව 60%ක් සහ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු 40% ක් වශයෙන් ගෙන කුසලතා අනුපිළිවෙළ මත තෝරා ගැනීම සිදු කෙරේ.
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පමණක් තෝරා ගැනෙන විට හුදෙක්ම එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාගත්තා කුසලතා අනුපිළිවෙළ මත තෝරා ගනු ලැබේ.

**ඉහත තනතුරු අංක 01 හා 02 දක්වා වයස -**

අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

**වෙනත්** - සෑම බඳවා ගැනීමක් සම්බන්ධයෙන්ම ආයතනික කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන අදළ වේ.

**අමතර ප්‍රතිලාභ** - නේවාසික හා බාහිර වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ පහසුකම්.

1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදලේ පනතට හෝ එකී පනත යටතේ ඇති සේවකයන්ගේ වෙනත් අර්ථසාධක

අරමුදලකට හෝ තෝරාගනු ලබන අයදුම්කරු විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ සේවය කරන සම්පූර්ණ කාලය තුළදී ඔහුගේ / ඇයගේ සම්පූර්ණ මාසික වැටුපෙන් 10% කට නොඅඩු මුදල් ප්‍රදානය කරනු ලබන අතර, අධිකාරිය විසින් 15% කට නොඅඩු මුදලක් සාමාජික මුදල් වශයෙන් ගෙවනු ඇත.

ඊට අමතරව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා 3% ක් අධිකාරිය විසින් ගෙවනු ලැබේ.

**අයදුම්පත්** - අයදුම්කරුවන් සියලු විස්තර සමග තම අයදුම්පත් උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, පළපුරුද්ද දක්වෙන සහතික හා වෙනත් කුසලතා හා කාර්ය සාධනයන්හි සහතික යන සහතිකවල පිටපත් සමග පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදළ තනතුර සඳහන් කළ යුතුය. රාජ්‍ය / රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් තම සේවා ප්‍රධානියා මාර්ගයෙන් ඔහුගේ / ඇයගේ නිර්දේශ සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

**අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය**

2023 දෙසැම්බර් මස 14 වැනි දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් අය වෙත ලැබෙන සේ එවිය යුතුය.

**සභාපති,**
**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,**
**අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත,**
**බත්තරමුල්ල.**